## 11 ශ්‍රේණිය     බුද්ධ ධර්මය     11 පත්‍රය

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01 - 1 | 11 - 2 | 21 - 1 | 31 - 4 |
| 02 - 3 | 12 - 2 | 22 - 2 | 32 - 3 |
| 03 - 3 | 13 - 2 | 23 - 1 | 33 - 1 |
| 04 - 4 | 14 - 4 | 24 - 4 | 34 - 3 |
| 05 - 2 | 15 - 1 | 25 - 4 | 35 - 1 |
| 06 - 1 | 16 - 4 | 26 - 1 | 36 - 2 |
| 07 - 2 | 17 - 2 | 27 - 3 | 37 - 3 |
| 08 - 3 | 18 - 1 | 28 - 4 | 38 - 2 |
| 09 - 2 | 19 - 3 | 29 - 3 | 39 - 1 |
| 10 - 1 | 20 - 1 | 30 - 2 | 40 - 2 |

11 කොටස

(i) අංගුලිමාල දමනය නාලාගිරි ඇතා දමනය සුචිරෝම, ඛරරෝම ආදී යක්ෂයින් දමනය ,උපාලි ගෘහපති දමනය ......ආදියෙන් දෙකක්

(ii) ලාබ - අලාභ, යස - අයස, නින්දා - ප්‍රශංසා, සැප - දුක

(iii) සමථ භාවනාව, විදර්ශනා භාවනාව

(iv) දස පාරමිතා

(v) රාග, ද්වේශ, මෝහ, ශ්‍රද්ධා, බුද්ධි, විතර්ක

(vi) වීදාගම මෛත්‍රිය හිමි

(vii) යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ
තේසංචයෝ නිරෝධෝ - ඒවං වාදී මහා සමණෝ

(viii) ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති

(ix) බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම

(x) නුසුදුසු වේලාවේ මංමාවත්වල හැසිරීම, නැටුම් ගැයුම්වලට ලොල්වීම, සුදුව, පව්ටු මිතුරන් ඇසුර, අලසකම, මධ්‍යසාර භාවිතය

( ලකුණු 2x 10 =20)

(2) (i) අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය (ලකුණු 02)

(ii)
- ⋆ කොසොල් රජු වැනි ප්‍රභූන්ගේ දාන මෙන්ම දිළිඳු අයගේ දාන ද සම මෙතින් පිළිගැනීම
- ⋆ අනේපිඩු සිටුතුමා, විශාඛා උපාසිකාව වැනි අය පූජා කළ ආරාම මෙන්ම රුක්මුල් සෙනසුන්වල සම මෙතින් පිළිගැනීම
- ⋆ වේරංජා නුවර වස් විසූ අවස්ථාවේ (12 වස් කාලය) සිවුපසය නොලැබුණ ද ඉවසීම
- ⋆ සුප්පිය, බ්‍රහ්මදත්ත දෙදෙනාගේ ප්‍රකාශ ඉවසීම
- ⋆ සුන්දරී පරිබ්‍රාජිකාවගේ සිද්ධිය, මාගන්ධියාගේ චෝදනා ආදිය ඉවසා සිටීම (ලකුණු 03)

(iii) සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න (ලකුණු 05)

(3) (i) දාන, සීල, නෙක්ඛම්ම, ප්‍රඥා, වීර්ය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපේක්ඛා

යනාදී පාරමිතාවලින් දෙකක්

(ii) නම් කර ඇති පාරමිතාවලින් එකක් විස්තර කර තිබිය යුතුය. (පෙළ පොත 11 ශ්‍රේණිය 03 පාඩම පිටු අංක 18-29)

(iii) අධිෂ්ඨානය, ප්‍රඥාව, සීලය, වීර්ය ආදී පාරමිතා ශිෂ්‍ය ජිවිතය සාර්ථක කර ගැනීමට හේතුවන අයුරු විස්තර විය යුතුය. සමස්තයක් වශයෙන් ගත් විට පාරමිතා 10 ම ශිෂ්‍ය ජිවිතය සාර්ථකත්වයට හේතු වේ.

(4) (i) තංච කම්මං කතං සාධු - යංකත්වා නානු තප්පති
යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටි සේවතී

(ii) යමක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේ ද යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේද එබඳු ක්‍රියාවල නිරත විය යුතුය.

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු බලා ලකුණු දෙන්න.

(5) (i) කය වචනය සංවර කර ගැනීම සීලයයි,

(ii) පන්සිල්, අටසිල්, දස සිල්, උපෝසථ අෂ්ටාංග සීලය, ආජීව අෂ්ටමක සීලය

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා සුදුසු පරිදි ලකුණු දෙන්න,

(6) (i)
- ⋆ දුක ආර්ය සතයය
- ⋆ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
- ⋆ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
- ⋆ දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය යනුවෙන් හෝ දුක, දුකට හේතුව, දුක නැති කිරිම, දුක නැති කිරීමේ මග යනුවෙන් තිබිය යුතුය.

(ii) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි

දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යනු දුක ඇතිවිමට හේතුව යන්නයි. දුක ඇතිවීමට හේතුව තණ්හාවයි. තණ්හාව ප්‍රභේද තුනකි. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙනි.

(iii) චතුරාර්ය සත්‍යය
- ⋆ දුක
- ⋆ දුකට හේතුව
- ⋆ දුක නැති කිරිම
- ⋆ දුක නැති කිරිමේ මග

ගැටලුවක දී

- ගැටලුව
- ගැටලුවට හේතුව
- ගැටලුව නැති කිරීම
- ගැටලුව නැති කිරීමේ මග ආදී වශයෙන් ගෙන ඕනෑම ගැටලුවකට විසඳුම ලබාදෙන අයුරු විස්තර විය යුතුය.

උදා

- ගැටලුව - විභාගය අසමත්වීම
- ගැටලුවට හේතුව - පාඩම් වැඩ නොකිරීම
- ගැටලුව නැති කිරීම - පාඩම් වැඩ කිරීම
- ගැටලුව නැති කිරීමේ මග - දිනපතා පාසල් යාම නිරන්තරයෙන් පාඩම් වැඩ කිරීම අභ්‍යාස ලිවීම

මේ ආදී වශයෙන් සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

(7) (i) වීර්ය පාරමිතාව

බලාපොරොත්තු ඉටුවන තුරු නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම වීර්යයි. පසුබැසීමට හේතු වන කුමක් ඉදිරිපත් වුවද ඒ එකකින්වත් මන්දෝත්සාහී නොවී කටයුතු ඇරඹීමටත්, ඇරඹි කටයුතු ඉදිරියට කරගෙන යාමටත්, උත්සාහ දැරීම වීර්ය පාරමිතාවයි. වීර්ය පාරමිතාවක් වීමට නම් තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොරව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුවීම අවශ්‍ය වේ. වීර්ය පාරමිතාව වීර්ය පාරමී, වීර්ය උප පාරමී, වීර්ය උප පරමත්ථ පාරමී යනුවෙන් කොටස් තුනකට බෙදේ.

ආරම්භක ධාතු, නික්ඛම ධාතු, පරක්ඛ ධාතු ආදී වශයෙන් අවස්ථා තුනේදීම වීර්ය කළ යුතුය. බෝසතාණන් වහන්සේ වීර්ය පාරමිතාව සම්පූර්ණ කළ අයුරු වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකටවේ.

(ii) අනගාරික ධර්මපාලතුමා

දෙමාපියන් වන්නේ දොන් කරෝලිස් හේවාවිතාරණ හා මල්ලිකා ධර්ම ගුණවර්ධන මැතිණියයි. ඔහුගේ මුල් නම දොන් ඩේවිඩ් හේවාවිතාරණ ය. මෙතුමා ලංකාවාසී ජනතාව යහමගට ගැනීමට බොහෝ සෙයින් කටයුතු කර ඇත. ඕල්කට්තුමා, බ්ලැවැස්කි මැතිණිය යන අයගේද සහාය ඇතිව මෙම කටයුතුවල නිරත විය.'' සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිමු'' යනුවෙන් සිංහලයන් අවදි කර ගනිමින් බුදුදහම බේරා ගැනීමට කටයුතු කළේය. එතුමා මුල් නම අතහැර ධර්මපාල යන නම භාවිතා කළ අතර බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කළ බැවින් අනගාරික ධර්මපාල නම් විය. සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදි භාවයට ද ඇතුළත් විය. (සිසුන් ලියා ඇති පිළිතුරු බලා ලකුණු දෙන්න)

(iii) උට්ඨාන සම්පදා

බුදු රජාණන් වහන්සේ ව්‍යග්ගපජ්ජ සූත්‍රයේදී මෙලොව දියුණුවට හේතු වන කරුණු හතරක් දේශනා කර ඇත. ඉන් එකක් ලෙස උට්ඨාන සම්පදා දැක්වේ. ඉන් අදහස් වන්නේ තමන් කරන රැකියාව උත්සාහයෙන් දැතේ මහන්සියෙන් දහදිය හෙළා ධාර්මිකව ධාර්මික ක්‍රියා අනුගමනයෙන් ක්‍රියාත්මක කළ යුතු බවය. එසේ කළ යුතු ධාර්මික රැකියා ලෙස කෘෂි කර්මාන්තය, වෙළඳාම, ගවයන් රැක බලා ගැනීම, දුනු ශිල්පය, රාජ්‍ය සේවය හා වෙනත් කර්මාන්ත වශයෙන් දැක්විය හැකිය.

(iv) ස්තූපය

වෙහෙර, දාගැබ, චෛත්‍යය, ථූපය, චේතිය යන නම්වලින් ස්තූපය හඳුන්වයි. බුදු, පසේ බුදු, මහ රහත් උතුමන්ගේ ධාතු හා විවිධ පූරා වස්තු නිදන් කොට ස්තූප සාදා ඇත. මහා වංසයට අනුව ලක්දිව ඉදිවූ මුල්ම ස්තූපය මහියංගනය ලෙස සැලකෙන අතර බුදු දහම පැමිණීමෙන් පසු ලක්දිව ඉදිවූ මුල්ම ස්තූපය වශයෙන් සැලකෙන්නේ ථූපාරාමයයි. ගර්භයේ හැඩය අනුව ස්තූපය සයාකාරය. ඒවා නම් ධාන්‍යාකාර, බුබ්බුලාකාර, ඝණ්ඨාකාර, ඝටාකාර, ආමලකාකාර වශයෙනි.